**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2020**

-----------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිත අංක 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රිය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම කාලානුරූපීව සිදුකරනු ලබන ආයු ගණක තක්සේරුව මඟින් ගණනය කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසු දිගින් දිගටම එවැනි ආයු ගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව ගණනය කර තිබූ අතර 2020 දෙසැම්බර් 31 විශ්‍රාම වැටුප් වගකීම රු.74,155,908,494 ක් විය. තවද මෙම බැදීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර නොතිබුණි. | 2007 වර්ෂයේදී සිදු කරන ලද ආයුගණක තක්සේරුව පදනම් කරගෙන විශ්‍රාම වැටුප් වගකීම ගිණුම් ගත කර ඇත. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුක්ත නොවන බැවින් ඉදිරියේදී මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර නිසි පරිදි වගකීම තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ. | විශ්‍රාම වැටුප් වගකීම ආයුගණක තක්සේරුව අනුව කාලානුරූපීව ගණනය කළ යුතුය |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දායකයින් විශ්‍රාම වැටුප සඳහා බැඳුන දිනය සහ හිමිකම් පාන දිනය ඇතුළත් දායකයින්ගේ නාම ලේඛනය, සක්‍රීය දායකයින්ගේ මාසික දායක මුදලේ වටිනාකම සහ හිමිකම් ඔප්පුව අක්‍රිය වූ දායකයින්ගේ නාම ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන නොයාම නිසා දායක මුදල් උපචිත පදනමට ගිණුම් ගත නොකර | මුදල් ලැබීම් වලට අදාළ තොරතුරු සඳහා නිසි අයුරින් ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු ලබයි. මාසිකව යාවත්කාලීන වන විශ්‍රාම වැටුප් නාමලේඛනය පරිගණක පද්ධතිය තුළින් ලබාගත හැක. යෝජනා ක්‍රමයේ දායකත්වය ලබාගෙන ඇති දායකයින්ගේ තොරතුරු | විශ්‍රාම වැටුප් දායකයින්ගේ විස්තර යාවත්කාලීන කර පවත්වාගෙන යා යුතු අතර දායක මුදල් උපචිත පදනමට ගිණුම් ගත |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දායකයින්ගෙන් ලද ආදායම රු. 96,476,139 ක් පමණක් මුදල් පදනමට මූලා ප්‍රකාශනවල දක්වා තිබුණි. | පරිගණක පද්ධතිය තුළින් ලබාගත හැක. පසු වාරික පරිගණක ගත කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇති බැවින් අවලංගු වූ හා අක්‍රිය වූ දායකයින් පද්ධතිය තුළින් ලබාගැනීමට අපහසු වී ඇත. මෙම තත්ත්වය හමුවේ පසු වාරික ස්වයංක්‍රීයව පරිගණක ගත කිරීම සඳහා රාජ්‍ය වාණිජ බැංකු මගින් පසු වාරික අයකර එම වාරික අප දත්ත පද්ධතියට සම්බන්ධ කරගැනීමේ විශේෂ වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. දායකයින් විසින් නිශ්චිත වශයෙන් ගෙවන ලද සියළුම වාරික ආදායම, වාරික ආදායම තුළ ගිණුම්ගත කර ඇත. | කළ යුතුය. |

### 1.5.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනා ක්‍රමයේ ශුද්ධ වත්කම් සමාලෝචිත වර්ෂය අවසානයට රු.78,198,513,683 ක සෘණ ශේෂයක් ගෙන තිබූ අතර ජංගම වත්කම් ඉක්මවා ජංගම වගකීම් රු.5,028,075,667 ක් වී තිබුණි. තවද 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබෙන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ නියෝග පරිදි 2014 ජනවාරි 01 දින සිට විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කළද දායක මුදල් අයකර ගැනීම 1987 මැයි 07 දිනැති අංක 452/12 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර තිබූ ක්‍රමය පරිදි සිදුකර තිබුණි. ඒ අනුව 2019 හා 2020 වර්ෂ වලදී ගොවි දායකත්වය පිළිවෙලින් රු.21,495,773 ක් හා රු.19,316,409 ක් වූ අතර විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිවෙලින් රු.3,217,332,522 ක් හා රු.4,502,560,108 ක් වී තිබුණි. විශ්‍රාම වැටුප් ගෙවීම් ඉහළ යාම නිසා 2019 හා 2020 වර්ෂ වලදී පිළිවෙලින් රු.3,065,000,000 ක් රු.4,450,949,000 ක් භාණ්ඩාගාරය මගින් ලැබී තිබූ අතර භාණ්ඩාගාරයේ දායකත්වය නොමැතිව යෝජනා ක්‍රමය පවත්වාගෙන යා නොහැකි තත්ත්වයක පවතී. | මේ සඳහා රු.මි. 750 ක ආරම්භක ප්‍රාග්ධනය සම්පූර්ණයෙන් නොලැබීම, වාරික වැඩි නොකර වරින් වර ප්‍රතිලාභ 200 සිට 1000 දක්වා වැඩි කිරීම, 1995 රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුව කලත්‍රයාට විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීම, යන කරුණු බලපා ඇත. 2014 වර්ෂයේදී නිකුත් කළ නව ගැසට් පත්‍රය සමඟ ඇති වූ අනාගත බැඳීම් සඳහා 2015 අයවැය මගින් රු.මි.5 ක භාණ්ඩාගාර බැඳුම්කර ආරම්භයක් වශයෙන් ලබාදීමට තීරණය වුවද, එම අරමුදල් මණ්ඩලය වෙත නොලැබුණු අතර, වාර්ෂික විශ්‍රාම වැටුප් වගකීම පමණක් මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන ලදී. ප්‍රමාණවත් ආයෝජන ගොඩනැගීම සඳහා මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අවශ්‍ය අරමුදල් ලබා ගැනීම සඳහා කටයුතු කිරීමට අපේක්ෂිතය. | යෝජනා ක්‍රමය සක්‍රිය කර ගැනීමට කටයුතු කළ යුතුය |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | | | |
| (i) 4 වන වගන්තිය | නියමිත සුදුසුකම් දරන්නාවූ ද ගොවිතැන් කටයුතුවල යෙදෙන ගොවීන්හට තම වෘත්තීය කටයුතු කරගෙන යාමට නොහැකි ස්ථිර, අර්ධ හෝ පූර්ණ දුබලතාවයක් වූ විට ආර්ථික වශයෙන් යම් පිටුවහලක් වීමට දීමනාවක් ගෙවීම, මරණයකදී මරණ පාරිතෝෂිකයක් ගෙවීම හා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම වැටුපක් ගෙවීම අරමුණු කරගෙන මෙම යෝජනා ක්‍රමය ආරම්භ කර තිබුණද 2012 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා යෝජනා ක්‍රමයට කිසිදු සාමාජිකයෙකු බඳවාගෙන නොතිබුණි. | වාරික වැඩිකිරීමකින් තොරව, රාජ්‍ය ප්‍රතිපත්ති හා තීරණ මත ප්‍රතිලාභ වැඩිකිරීම නිසා 1987 වර්ෂයේ ආරම්භවූ යෝජනා ක්‍රමයෙහි 2010 වර්ෂය වන විට අරමුදල ශූන්‍ය වූ බැවින් යෝජනා ක්‍රමයට බඳවා ගැනීම නවතන ලද බැවින් නව බඳවාගැනීම් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. 2014 1853/49 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව නව බඳවා ගැනීම් ආරම්භ කිරීම සඳහා කැබිනට් මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර, එහිදී වැඩිදුරටත් ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සඳහා නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුතු විශේෂඥ කමිටුවක් පත්කරන ලදී. එම කමිටුවේ නිර්දේශයට අනුව, නව බඳවා ගැනීම් ආරම්භ කිරීමට නියමිත ව ඇත. | යෝජනා ක්‍රමය සක්‍රිය කර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ii) 6(1) වගන්තිය | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට සාමාජිකයන් හට විශ්‍රාම වැටුප් ගෙවිය යුතු වුවත් විශ්‍රාම වැටුප් ගෙවිය යුතු දින සිට නොව විශ්‍රාම වැටුප සකස් කළ දින සිට ගෙවීම් සිදු කර තිබූ අතර, එම කාල පරාසය තුළ ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප් සඳහාද ප්‍රතිපාදනය කර තිබුණද 2012 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා වර්ෂ 8 කට අදාළ ගොවීන් 125,828 ක් සඳහා ප්‍රතිපාදිත හිඟ විශ්‍රාම වැටුප් එකතුව රු.3,745,948,105 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම වැටුප් ලැබීමට පොරොත්තු ලේඛනයේ සිටි 20,000 කට අධික ගොවීන් සංඛ්‍යාවක් ලේඛනගත කිරීමට සිදු වූ නිසා ප්‍රමාදයන් සිදුව ඇත. ඉදිරියේදී හිඟ මුදලක් ඇති නොවන පරිදි විශ්‍රාම වැටුප් හිමිකම ලබන අවස්ථාවේදීම ලේඛනගත කරන බැවින් ගෙවිය යුතු හිඟ විශ්‍රාම වැටුප් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගෙන ක්‍රමිකව ගෙවීමටත් නියමිතය. | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ගොවි විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 15(2)වන සහ (3)වන වගන්ති | දායකයෙකු දායක මුදල් ගෙවීමේදී වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක අභියාචනයක් කිරීම සඳහා ඒ බව දායකයා වෙත දැනුවත් කිරීම් කළ යුතුයි. එසේ වුවද එම දැන්වීම නොකිරීම හේතුවෙන් වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප් ලැබීමේ හිමිකම ඇති බව අදහස් කරමින් පුද්ගලයින් 1,451 ක් දෙනෙකු විසින් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. | දායකයින් අඛණ්ඩව වාරික 05 ක් ගෙවීම පැහැර හැරියහොත් දායකත්වය අවලංගු වන බව යෝජනා ක්‍රමයට දායක වන අවස්ථාවේදී ඔවුන් වෙත ලබාදෙන වාරික මුදල් සටහන් පොතේ සහ සහතික ඔප්පුවෙහි පැහැදිලිව සටහන් කර ඇත. එසේ දායකත්වය අවලංගු වූ ගොවීන්ගේ ගෙවූ වාර මුදල් ඔවුන්ගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී පොලියද සමගින් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරනු ලැබේ. | වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දායකයා වෙත දැනුවත් කිරීම් කළ යුතුය. |
| (iv) | 20 වන වගන්තිය | පිහිටුවා ඇති උපදේශක කාරක සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු බලතල ක්‍රියාත්මක කිරීමට උපදේශක කාරක සභාව රැස්විය යුතු වුවත් 2016 නොවැම්බර් මාසයෙන් පසුව මේ දක්වාම කාරක සභාව රැස්වී නොතිබුණි. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා බඳවා ගැනීම් ආරම්භ කරමින් සක්‍රිය කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින අතර, ඒ අනුව ඉතා කඩිනමින් උපදේශක කාරක සභාව රැස්කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අපේක්ෂිතය. | පනත ප්‍රකාරව උපදේශක කාරක සභාව රැස්විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.67,897,112 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.58,984,104 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 126,881,216 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාර ප්‍රදාන පසුගිය වසරට සාපේක්ෂව රු.1,397,949,000 කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 වර්ෂයේ ආරම්භ කරන ලද නව යෝජනා ක්‍රමය හා පැරණි යෝජනා ක්‍රමය සැසදීමේදී නව යෝජනා ක්‍රමය තුළින් ගොවීන්ට ලැබෙන ප්‍රතිලාභ ඉතා අඩු මට්ටමක පැවතුණි. එසේ හෙයින් 2016 – 2020 සංයුක්ත සැලැස්මෙහි නව යෝජනා ක්‍රමය යාවත්කාලීන කිරීම සහ නව සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම සඳහා සැලසුම් සකස් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම කාර්යය ඉටුවී නොතිබුණි. | 2021 වර්ෂය තුළදී ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යාවත්කාලීන කරමින් නව බඳවා ගැනීම් ආරම්භ කිරීමටත්, එය ක්‍රියාත්මක කිරීමේදී නව තාක්ෂණික ක්‍රම යොදා ගැනීමටත්, සැලසුම් කර මේ වන විට එය ක්‍රියාත්මක කරමින් පවතී. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝම්බර් දක්වා දළ වශයෙන් ගොවි විශ්‍රාමිකයින් 161,000 ක් වෙනුවෙන් රු.3,809,491,790 ක මුදලක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දිසා ගිණුම් කාර්යාල 14 ක් වෙත නිකුත් කර තිබූ අතර විගණන අවස්ථාව වන විට නොගෙවූ විශ්‍රාම වැටුප් රු.76,019,485 ක් මණ්ඩලය වෙත ආපසු එවා තිබුණි. විශ්‍රාම වැටුප් මුදල් ලබා නොගැනීමට පාදක වූ හේතූන් සොයා බැලීමට හා හිමිකම් නොපාන විශ්‍රාමිකයන් පිළිබඳව තොරතුරු කැඳවා දැනට ජීවත්ව නොසිටින්නේ නම් විශ්‍රාමික නාම ලේඛනයෙන් නම් ඉවත් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | කොරෝනා වසංගතය හේතුවෙන් පිටපළාත්වලට ගොස් ආපසු නිවෙස් කරා පැමිණීමට නොහැකිව දීර්ඝකාලීනව එම ස්ථාන වල රැඳී සිටීමට සිදුවීම නිසා විශ්‍රාම වැටුප ලබාගැනීමට නොහැකිවීමෙන් මෙම තත්වය උද්ගත වී ඇත. මාස 06 ක පමණ කාලයක් විශ්‍රාම වැටුප් නොගන්නා විශ්‍රාම වැටුප් ලාභීන්ගේ විස්තර සැසඳුමට ලක්කර ඔවුන් විශ්‍රාම වැටුප් ගෙවීමේ ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇත. | විශ්‍රාමික නාම ලේඛනය යාවත් කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) 1992 – 2002 දක්වා කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ බැංකු ගිණුම් 3 කට අදාළව රු.1,179,624 ක් වටිනා චෙක්පත් 117 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් නිරවුල් කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව 2021 ජනවාරි 22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 509/04 මගින් අනුමැතිය හිමි වීමෙන් අනතුරුව මෙම තත්වය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | කරුණු සොයා බලා උපලබ්ධි නොවූ චෙක්පත් නිරවුල් කරගත යුතුය. |
| (ඇ) 2014 ජනවාරි සිට ක්‍රියාත්මක වූ නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළත් ගොවි දායකයින්ගේ ජීව දත්ත තොරතුරු ඇතුළත් කර පද්ධතිය යාවත්කාලීන කිරීම අරමුණු කරගෙන රු.1,726,875 ක් වැයකර දිස්ත්‍රික්ක 08 ක පමණක් සමීක්ෂණ කටයුතු සිදු කර තිබූ අතර අනිකුත් දිස්ත්‍රික්කවල සමීක්ෂණ කටයුතු සිදු කර දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට මණ්ඩලය කටයුතු නොකිරීම නිසා ඒ වෙනුවෙන් දරන ලද වියදම නිෂ්කාර්ය බවට පත්වී තිබූ අතරම නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළත් ගොවි දායකයින්ගේ ජීව දත්ත තොරතුරු ඇතුළත් කිරීමේ කටයුතු 2020 වර්ෂය අවසන් කාල පරිච්ඡේදය තුළ නවතා දමා තිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකත්ව තොරතුරු යාවත්කාලීන කිරීමේ වැඩසටහනේදී, තොරතුරු ඉදිරිපත් කර තිබූ ගොවීන්ගේ සංඛ්‍යාව අඩු අගයක් ගත්ත ද ලැබී ඇති තොරතුරු දිස්ත්‍රික් මට්ටමින් පරිගණක ගත කොට යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. සමීක්ෂණය සඳහා ගොවීන්ගේ ප්‍රතිචාර අවම අගයක් ගත් බැවින් සමීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදුකිරීම නවතා දමන ලදී. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළත් ගොවි දායකයින්ගේ ජීව දත්ත තොරතුරු ඇතුළත් කර පද්ධතිය යාවත්කාලීන කිරීම කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට විශ්‍රාම වැටුප් සැකසීම සඳහා අයදුම්පත් 7,402 ක් ඉදිරිපත් වී තිබූ අතර ඉන් අයදුම්පත් 1,837 කට ප්‍රතිලාභ ලබා දීමට අපොහොසත්ව තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසන් වන විට විශ්‍රාම වැටුප් සැකසීම සඳහා ඉල්ලුම්පත් 7,402 ක් ලද අතර උපරිම කාර්යක්ෂමතාවයෙන් කටයුතු කරන ලදී. මේ නිසා අයදුම්පත් ප්‍රමාණය 1,000 කට වඩා අඩුකර ගැනීමට සමත්ව ඇත. ඉදිරියේදී ප්‍රමාදයන්ගෙන් තොරව විශ්‍රාම වැටුප් ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන අතර, නව තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරමින් පරිගණක පද්ධතිය දිස්ත්‍රික් කාර්යාල හා සම්බන්ධ කරමින් කඩිනම් සේවාවක් ගොවි ජනතාව වෙත ලබාදීමට අපේක්ෂා කෙරේ. | ගොවි ජනතාව වෙත කඩිනමින් ප්‍රතිලාභ ලබාදිය යුතුය. |